# බුදුරජාණන් වහන්සේ භාවිත කළ අධ්‍යාපන ක්‍රමශිල්ප

මැටිබැඹියේ ධම්මසිරි හිමි[1]

බුදුරජාණන් වහන්සේ වනාහි භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සියලු දෙනාට ජීවිතය හා සමාජය පිළිබඳ විශිෂ්ඨතම ඥාන සම්භාරයක් දායාද කරමින් නිවැරදි මාර්ගය පෙන්වාදුන් අද්විතීය ශාස්තෘවරයා ය. උන්වහන්සේ අන් ශාස්තෘවරුන්ට වඩා විශිෂ්ටතම වූ ඥානයෙන් හෙවත් විද්‍යාවෙන් ද, ප්‍රතිපදාවෙන් හෙවත් චරියාවෙන් ද සම්පූර්ණත්වයටපත් ආචාර්යවරයා ද වේ. ක්‍රි. පූ. හයවන සියවසේ භාරතීය සමාජයේ බුදුදහමේ පහළවීමත් සමග සමාජයේ පැවති බෝහෝ දුර්වලතා මඟහැර ආගමික, සමාජීය,ආර්ථික, දේශපාලනික, අධ්‍යාපනික යන සෑම විෂයක්ෂෙත්‍රයක්ම නව මඟකට හරවාලීමට බුදුරජාණන් වහන්සේට හැකියාව ලැබී තිබූ බව පැහැදිලි ය. සාම්ප්‍රදායික අධ්‍යාපනික රටාවන් වෙනස් කරමින් ශිෂ්‍යාට හිතාමතා නිවැරදි තිරණ ගැනීමට හැකි අධ්‍යාපන රටාවක් හෙවත් පූර්ණ දැනුම් සම්භාරයක් ලබාදීමට ගුරුවරයෙක් වශයෙන් භාවිත කළ අධ්‍යාපන ක්‍රම ශිල්ප පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ.

බුදුරජාණන් වහන්සේ වනාහි පළමුව සත්‍යය අවබෝධකරගෙන අන්නායන්ටද එම නිවැරදි මාර්ගය පෙන්වා දුන් උතුමන් වහන්සේ වෙති. එනම් සියලු දෙනා හික්මවීම සඳහා, කෙලෙස් දුරුකර ගැනීම සඳහා ධර්මය දේශනා කරනු ලබයි. ආචාර්යවරයෙකු වශයෙන් සියලු දෙනා හික්මවීම පිණිස කටයුතු කළ අයුරු මෙවැනි උදාහරණ මඟින් පැහැදිලි වේ. දිනක් මාරයා විසින් බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණ ඔබ දැන් පිරිනිවන් පෑමට සුදුසු කාලය බව පෙන්වා දෙයි. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ විසින් දෙනු ලැබූ පිළිතුර තුළින් ගුරුවරයෙකුගේ ගුරු භූමිකාව මැනවින් ප්‍රත්‍යක්ෂ වේ. "මාරය භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්පිරිස නියම ශ්‍රාවක භාවය ලබනතුරු, නුවණැත්තවුන් වන තුරු, මනාසේ පුහුණුව ලබා බහුශ්‍රැත වන තුරු, ධර්මය මැනවින් හදාරා ධර්මානුකූලව කටයුතු කරන තුරු, ධර්මය අන්නායන්ට ප්‍රගුණ කිරීමට හැකියාව ලැබෙන තුරු මම පිරිණිවන් නොපාන්නෙමි" යනුවෙන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. ඒ අනුව ස්වකිය කාර්යය ඉටුකිරීමෙහිලා ආචාර්යවරයෙකු වශයෙන් භාවිත කළ උපාය මාර්ගයන් රාශියක් පෙළදහමෙහි විස්තර වේ. උන්වහන්සේ ස්වකීය ශිෂ්‍යය ප්‍රජාව නිවැරදි මාර්ගයට යොමු කිරීමේදී භාවිත කළ ශිල්පීය අභිමතාර්ථය අතරින් කිහිපයක් පෙන්වා දීම මෙහිදී බලාපොරොත්තු වේ.

**ප්‍රමුඛ පද** : අධ්‍යාපන, ඉගැන්වීම, ක්‍රමවේදය, ශ්‍රාවකයන්

---

1 සහය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
dhammasiri85@gmail.com